THE JOURNAL OF LANGUAGE AND CULTURE

Volume 2 - Issue I
October-November 2024

T J O L C
ISSN 2806-5395

Category: Research Article

# සිංහල අක්ෂර මාලාවේ ව්‍යුහය සම්බන්ධ ව කුමාරතුංග මුනිදාසගේ විවේචන පිළිබඳ විමසුමක්

ගිනිකටුවැවේ විපුල හිමි

**ARTICLE DETAILS**

Published Online & Printed
October-November 2024

*Author:*

**Ginikatuwewe Vipula**
***Lecturer (Tem.)***
Department of languages
Faculty of Social Sciences and Humanities
Rajarata University of Sri Lanka
Mihinthale
Email: *gvipula260@gmail.com*

***Keywords***:
Aksharasiksha alphabet, Cumaratunga, Placing letters, Sinhala alphabet, Structure of the Sinhala alphabet

## Abstract

A formal structure of an alphabet is the culmination of phonological knowledge. Therefore, only an elementary phonologist can make logical criticisms about the structure of a formal alphabet. Thus, criticism of the structure of an alphabet is a reflection of the knowledge of those phoneticians. Cumaratunga Munidasa, as a phonologist, has criticized the structure of the Sinhala alphabet. They are [*æ] [æ:]* the two letters should be the initial letters of the Sinhala alphabet, retroflex [*Ḷ*] must be positioned in the middle of the [*R]* and [*L]* as [*R] - [Ḷ] - [ L]*, the *Visarga* should be taken in the category of fricative and shown as *[ʃ] [ṣ] [s] [h] [ɦ]*. Particularly, attention is given to the question of how Cumarathunga's views on the order of the Sinhala alphabet contrasted or agreed with the latter placement theory of the *Aksharasiksha* alphabet. This study helped to understand whether the structure of the Sinhala alphabet should be changed and the nature of Cumaratunga's phonology knowledge.

## හැඳින්වීම

කිසියම් අයකුට අක්ෂර මාලාවක ව්‍යූහය සම්බන්ධයෙන් විවේචනාත්මක අදහස් ඉදිරිපත් කළ හැකි වන්නේත් නව වර්ණමාලා ව්‍යූහයක් සැකැසිය හැකි වන්නේත් ශබ්ද විචාරයෙහි ප්‍රාමාණිකයකු වූ පසු ය. එයට හේතුව වන්නේ අක්ෂර මාලාවකට විධිමත් ව්‍යූහයක් සැකැසීම ශබ්ද විචාරාත්මක ඥානයේ අන්තයෙහි තිබීමයි. කුමාරතුංග මුනිදාස යම් කලෙක සිට ම අක්ෂර මාලාවේ පටිපාටිය පිළිබඳ අවධානයෙන් සිටි බවත් එහි දී අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ අක්ෂර පටිපාටිගත කිරීමේ න්‍යායට අන්‍යතර වූ අදහස් ද ඔහුට පැවැති බවත් පෙනේ. කුමාරතුංග තරු අකුරු වැළ සම්පාදනය කළ අවධියට පෙර ම එනම් 1939 දී විලියම් ගයිගර්ගේ සිංහල ව්‍යාකරණය විවේචනය කළ අවධිය වන විට අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ ව්‍යූහය යම් දුරට අවබෝධ කර ගෙන සිටි බවක් ද පෙනේ (කුමාරතුංග, 1939: 15-16). කෙසේ හෝ වේවා සංස්කෘත ශාබ්දිකයන් අක්ෂර ශික්ෂා වර්ණමාලාව පටිපාටිගත කිරීමේ දී අනුගමනය කළ ක්‍රමය පූර්ණ වසයෙන් අවබෝධ කර නොගැනීම නිසා හෝ ස්වාධීන චින්තනය නිසා හෝ කුමාරතුංග අක්ෂර පටිපාටිගත කිරීමේ දී ස්වායත්ත භාවයක් විශද කළ බව පැහැදිලි ව පෙනේ. මේ ස්වායත්ත භාවයේ මූලබීජ ලක්ෂණ ව්‍යාකරණ විවරණයේ දී දක්නට ලැබේ. එහි දී හෝඩිය දැක්වීමේ දී මූර්ධජ ළකාරය සහ විසර්ගය ස්ථානගත කළ ආකාරය සාම්ප්‍රදායික අක්ෂර පටිපාටිගත ක්‍රමයට වඩා වෙනස් ය. මූර්ධජ ළකාරය 'ය, ර, ළ, ල, ව' වසයෙනුත් විසර්ගය 'ශ, ෂ, ස, හ, ඃ' වසයෙන් ස්ථානගත කොට ඇත (කුමාරතුංග, 2000: 03). එමෙන් ම ''ඇ'යන්නෙන් හෝඩිය පටන් ගත යුතු ය' යන අදහසක් ද 'ඌෂ්මාක්ෂර ද ඒ ඒ වර්ගයන්හි ම යෙදිය යුතු ය' යන අදහසක් ද ඔහුට තිබී ඇත (කුමාරතුංග, 1940: 45-42; කුමාරණතුංග, 2009: 38-39). මේ නිගමනවලට පැමිණීමට කුමාරතුංග පෙළඹවූ අදහස් අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ අක්ෂර පටිපාටිගත කිරීමේ න්‍යාය සමඟ දක්වන අනුරෝධය හෝ ප්‍රතිරෝධය කෙසේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි.

## ක්‍රමවේදය

සිංහල අක්ෂර මාලාවේ අනුක්‍රමය පිළිබඳ ව කුමාරතුංග ඉදිරිපත් කළ නිගමන සහ ඒවාට හේතු වූ අදහස් කුමාරතුංගගේ කෘති සහ හෙළ හවුලේ වෙනත් ලේඛකයන්ගේ කෘති පරිශීලනයෙන් එකතු කොට ඒවායෙහි එන අදහස් අක්ෂර ශික්ෂා වර්ණමාලා අනුක්‍රමය පිළිබඳ පැහැදිලි කෙරෙන මූල ග්‍රන්ථ වන ශික්ෂා, ප්‍රාතිශාඛ්‍ය ග්‍රන්ථවල එන විවරණ සමඟ තුලනාත්මක ව විමර්ශනය කෙරේ. එසේ තුලනාත්මක ව විමර්ශනය කිරීමේ දී ශබ්ද විද්‍යාව සහ ශබ්දිම විචාරය පිළිබඳ නූතන වාග්විද්‍යාත්මක න්‍යාය සහ වර්ණමාලා සකස් කිරීමේ දී භාවිත කෙරෙන ලාඝවතාව, සමාන්තරතාව වැනි න්‍යාය ද භාවිත කෙරේ.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ ව්‍යූහය සම්බන්ධ ව කුමාරතුංගයන්ගේ විවේචන කුමාරතුංග තරු අකුරු වැළට ලියූ විවරණයේ දී පෙරදිග සහ අපරදිග භාෂාවන්හි

අක්ෂරමාලාවල ව්‍යූහය පිළිබඳ අවධානය දක්වමින් 'පෙරය මඳනුවණකු විසිනුත් අපරය මහනුවණකු විසිනුත් පෙළ ගස්වන ලද' බවක් පවසයි. අපරදිග භාෂාවන්හි හෝඩි සම්බන්ධ ව කුමාරතුංගගේ නිගමනය සාධාරණ ය. ඉංගිරිසි බසෙහි හෝඩියේ ව්‍යූහය විස්තර කිරීමට සරස්වතියට ද නොහැකි බව පැවසේ (Senevirathana, 2013). එහෙත් පෙරදිග භාෂාවල එන අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ ව්‍යූහය එසේ නොවන බවත් එය මඳනුවණකුගේ නිර්මාණයක් නොවන බවත් අක්ෂර ශික්ෂා වර්ණමාලාව පිළිබඳ විවරණය කිරීමෙන් පැහැදිලි වේ. ඒ කෙසේ වෙතත් කුමාරතුංගට අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ ව්‍යූහය මඳ නුවණකුගේ නිර්මාණයක් ලෙසට වැටහීමට බලපෑ කරුණු දෙකක් තරු අකුරු වැළට ලියූ විවරණයේ එයි. එනම්,

01 ඇකාරයට නිසි තැන ලැබී නැත හෙවත් ඇකාරය හෝඩියේ ආරම්භයේ ස්ථාපනය කළ යුතු ය.

02 ඌෂ්මාක්ෂර වර්ගාක්ෂරයන්ගෙන් පසු ව දැක්වීම වැරදි ය. ඒවා ඒ ඒ වර්ගයේ ම ස්ථාපනය කළ යුතු ය යන ආකල්ප දෙකයි.

තරු අකුරු වැළට ලියූ විවරණයේ දී අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ පටිපාටියේ දුර්වලතා වසයෙන් කුමාරතුංග විශේෂයෙන් සඳහන් නොකළ ද ව්‍යාකරණ විවරණයේ දී සිංහල අක්ෂර මාලාව දැක්වීමේ දී ඔහු අනුගමනය කළ පටිපාටිය ඇසුරෙන් මතු වන තවත් ආකල්ප දෙකක් ද ඇත. එනම්,

01 මූර්ධජ ළකාරය පවත්නා ස්ථානය වැරදි ය. එය අන්තඃස්ථ අක්ෂර කාණ්ඩයෙහි ම 'ර-ල' අතරෙහි ස්ථාපනය කළ යුතු ය.

02 විසර්ගය ඌෂ්මාක්ෂර කාණ්ඩයෙහි අන්තයෙහි ස්ථාපනය කළ යුතු ය යන ආකල්ප දෙකයි.

අක්ෂර ශික්ෂා වර්ණමාලාවට විරුද්ධ ව කුමාරතුංග දක්වා ඇති ඉහත අදහස් හතර ම විධිමත් ශාස්ත්‍රීය විමර්ශනයකට ලක් විය යුතු ය.

ඇකාරයෙන් හෝඩිය ආරම්භ කළ යුතු ය යන අදහස කුමාරතුංගගේ අවෑමෙන් දින නමයකට පසු (1944 මාර්තු 11 වන දින) 'සිංහල බලය' පුවත්පතට 'කුමාරතුංග කිවියාණෙනි' යන හිසින් යුතු ව ගුණ සැමරුම් කවිපෙළක් රචනා කළ වතුරේගම කවියා

'' 'අ' යනු නො වේ 'ඇ' යනු යැ හෝඩියෙහි　　　මුල
කියමින් කවිසුරෙනි ඔබ හඬ නඟන　　　කල
වියරු වැ දොඩවතැ යි සිතමින් දිව　　　පැකිළ
බිය වී බලා සිටියො ද සිහළ පඬි　　　කැළ''

(කුමාරණතුංග, 2009: 38-39)

යනුවෙන් දක්වන සඳහන අනුව 'අක්ෂර මාලාව ආරම්භ කළ යුත්තේ ඇකාරයෙන්' බවට මතයක් කුමාරතුංගට වූ බවක් පෙනෙයි. අක්ෂර මාලාව පිළිබඳ කුමාරතුංගගේ ස්වාධීන චින්තනයේ අග්‍රේසර අවස්ථාව වූ තරු අකුරු වැළේ දී අකාරයට මුලින් ඇකාරය නොදැක්වුව ද 'අකාරයට පෙරටු ව ඇකාරය පැමිණිය යුතු ය' යන මතයේ ශේෂයක් ඒ වන විටත් කුමාරතුංග සතු ව පැවැති බව තරු අකුරු වැළට ඔහු ලියූ විස්තරයේ එන '' 'අ' හෝ 'ඇ' හෝ පළමු ම දැක්වීම මැනවි'', (කුමාරතුංග, 1940: 51) '' 'ඇ' යන්නට නිසි තැන පිරිසුදු ලෙස නො දැක්වේ'' (කුමාරතුංග, 1940: 52) යන ප්‍රකාශවලින් පෙනේ. මේ මතය පිළිබඳ වැඩි විස්තරයක් කුමාරතුංග කිසියම් තැනක ලියූ බවක් දක්නට නැත. එහෙත් අලවු ඉසි සැබිහෙළ රුවන් පබඳ යන කෘතියෙහි දක්වන විස්තරය අනුව උක්ත මතයේ පදනම හඳුනා ගත හැකි ය.

'' 'ඉ, උ, එ, ඔ' යන මේ අකුරු නොනැම්, නැම්; නොනැම්, නැම් යන පිළිවෙළට නො වේ ද පෙළ ගැස්වී තිබෙන්නේ? ඉතින්, ' , අ, ඇ' යන අකුරුත් එසේ මැ පෙළ-ග ැසුවා ම නරක ද? ... 'ඇ, අ, ඉ, උ, එ, ඔ' මෙන්න, ඒ අයුරින් පෙළ ගැහැණු විටැ පණ හඬ වැළ සිටුනා හැටි. මේ පෙළ ගැස්ම දෙලෙසකින් විදුහුරු යැ. එක් ලෙසක් නම්, අකුරු උපදනා තැන් අනුවැ සකස් වීම යි. හෙළ කටෙහි මහ බලයක් පවත්වන නොනැම්, නැම් පිළිවෙළට එකඟ වැ ගැළපී සිටීමයි අනෙක් ලෙස නම්'' (සැබිහෙළ, 1961: 120).

අලවු ඉසි සැබිහෙළ 'අ'වර්ණයට පෙර 'ඇ'වර්ණය යෙදීම දෙඅයුරකින් විදුහුරු ලෙස දකියි. එනම්,

01 ස්වර අක්ෂර පටිපාටිගත කිරීමේ දී අනුගමනය කර ඇතැයි ඔහු සිතන නොනැම් - නැම් යන පිළිවෙළට අනුගත වීම

02 අකුරු උපදනා තැන් අනුව සකස් වීම අනුවයි.

මේ කරුණු දෙක ම සාවද්‍ය කරුණු දෙකකි. අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ ස්වර අක්ෂර පටිපාටිගත කිරීමේ දී කිසිදු අයුරකින් නොනැම් - නැම් යන පිළිවෙළක් අනුග මනය කොට නැත. එය සාවද්‍ය වැටහීමකි. අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ ස්වර අක්ෂර පටිපාටිගත කොට ඇත්තේ, සියලු ම ස්වර ඒකජ - ද්විජ වසයෙන් ප්‍රභේද කොට, ඒකජ ස්වර ද නැවත සරල ස්වර සහ ස්වරක ස්වර යනුවෙන් ප්‍රභේද කොට, ඒ ඒ ප්‍රභේදවලට අයත් ස්වර උත්පත්ති ස්ථාන අනුව ස්ථානගත කොට එහි දී ද පළමු ව හ්‍රස්වයත් දෙවනු ව දීර්ඝයත්, පළමු ව ගුණයත් දෙවනු ව වෘද්ධියත් වසයෙන් පටිපාටිගත කිරීමෙනි (විපුල හිමි, 2014: 141-197). සංස්කෘතයේ ද නාමින් - අනාමින් යනුවෙන් වර්ගීකරණයක් ඇතත් එය සිංහලයේ සාකච්ඡා කෙරෙන නාමින් (නම්‍ය/නැම්) - අනාමින් (අනම්‍ය/නොනැම්) යන ආකාරයේ වර්ගීකරණයක් නො වේ. සාරස්වත ව්‍යාකරණයේ එන 'අවර්ජා නාමිනඃ' යන සූත්‍රයට අනුව 'අ ආ' දෙක අනාමින් වන අතර අනෙක් සියලු ම ස්වර නාමින් වේ (රතනසාර හිමි, 1957: 10). අනාමින් වූ ස්වර දෙක අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ මුල ම ඇති

හෙයින් සහ නාමින් අක්ෂර පසු ව ඇති හෙයින් අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ ස්වර පිළිවෙළ ද නොනැමි - නැමි බව පෙනී යතත් එය සැබිහෙළ පවසන ආකාරයේ නොනැමි (පූර්ව ස්වර) - නැමි (අපර ස්වර) යන පිළිවෙළක් නො වේ. තව ද අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ පූර්ව ස්වර සහ අපර ස්වර පමණක් නො ව, මධ්‍ය ස්වර ද පවතින හෙයින් සිංහලයේ සාකච්ඡා කෙරෙන නම්‍ය - අනම්‍ය භේදය හෙවත් පූර්ව ස්වර - අපර ස්වර භේදය අක්ෂර ශික්ෂා වර්ණමාලාව පටිපාටිගත කිරීමේ දී අනුගමනය කළ නොහැකි ය.

'අ' වර්ණයට පූර්වයෙන් 'ඇ' වර්ණය දැක්වීම අකුරු උපදනා තැන් අනුව සකස් වීමක් බව සැබිහෙළ පැවැසුව ද හෙළ හවුලේ පිළිගැනීම්වලට අනුව ම එය සාවද්‍ය අදහසකි. කුමාරතුංගගේ පැහැදිලි කිරීම්වලට අනුව 'අ' වර්ණය පූර්ව කණ්ඨජ වන අතර 'ඇ' වර්ණය උත්තර කණ්ඨජ වේ (කුමාරතුංග, 2000: 18-19). ඒ අනුව හෙළ හවුලේ පිළිග ැනීම්වලට අනුව උත්පත්ති ස්ථාන පටිපාටියට අනුව පෙළ ගැස්විය යුතු වන්නේ 'ඇ, අ' වසයෙන් නො ව, 'අ, ඇ' වසයෙනි. කුමාරතුංග 'ඇ'යන්න හෝඩියේ මුලට ආ යුතු ය යන අදහස දැරුව ද තරු අකුරු වැළේ අක්ෂර පටිපාටිය සැකසීමේ දී අක්ෂර ස්ථානානුගත ක්‍රමය අනුගමනය කරමින් 'අ ඇ' යන පිළිවෙළ අනුගමනය කොට ඇත. ඒ හෙයින් ' 'ඇ' යන්නෙන් හෝඩිය පටන් ගත යුතු ය' යන අදහස අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ පටිපාටිය පිළිබඳ අනවබෝධයෙන් ඉදිරිපත් කළ සාවද්‍ය අදහසක් ලෙස පිළිගැනීමට සිදු වේ. එමෙන් ම කුමාරතුංග තරු අකුරු වැළට ලියූ විස්තරයේ දී අක්ෂර ශික්ෂා වර්ණමාලා අනුක්‍රමය මඳ නුවණැත්තකුගේ නිර්මාණයක් යැයි පිරිහෙළමින් එයට හේතු වසයෙන් දක්වන ' '' 'ඇ' යන්නට නිසි තැන පිරිසුදු ලෙස නො දැක්වේ'' (කුමාරතුංග, 2000: 52) යනුවෙන් දක්වන චෝදනාව අභූත චෝදනාවක් ලෙස බැහැර කිරීමට සිදු වේ. ඒ හෙයින් විද්‍යමාන සාධක අනුව කෝට්ටේ යුගයේ සිට ම අනුගමනය කළ, 'ඇ'වර්ණය 'අ'වර්ණයට පසු ව දැක්වීමේ ක්‍රමය (තෙන්නකෝන්, 1980: 38) ම සාධනීය ක්‍රමය බව පෙනේ.

## උෂ්මාක්ෂර ඒ ඒ වර්ගයේ ම ස්ථාපනය කළ යුතු ය යන අදහස

තරු අකුරු වැළට ලියූ විවරණයේ දී අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ දුර්වලතා විවේචනය කරමින් කුමාරතුංග ''උසුම් අකුරු ඒ ඒ වගෙහි ලා මැ දැක්වියැ යුතු යැ. අපේ අකුරු වැළෙහි ඇති උසුම් අකුරු දක්වන ලද්දේ වගින් බැහැර කොට යැ'' යනුවෙන් දක්වයි. තරු අකුරු වැළේ දී කුමාරතුංග එසේ ඌෂ්මාක්ෂර ඒ ඒ වර්ගයේ දක්වා ද ඇත. කිසියම් අයෙකුට ඌෂ්මාක්ෂර ද ඒ ඒ වගෙහි දැක්විය යුතු ය යන අදහස ඇති වීමට බලපෑ හැකි ප්‍රධාන ම කරුණ වන්නේ 'ක' සිට 'ම' තෙක් අක්ෂර 'වර්ගාක්ෂර' යනුවෙන් හැඳින්වීමයි.

පාලි ව්‍යාකරණකරුවන් භාවිත කළ 'වර්ගාක්ෂර' යන ද්විතීය සංඥා නාමය හේතුවෙන් වර්ගාක්ෂරවල ප්‍රථම සංඥා නාමයත්, උච්චාරණ ලක්ෂණයත් අභාවිතයට ගොස් ඇත. සංස්කෘත ශාබ්දිකයන් 'ක' සිට 'ම' තෙක් වූ අක්ෂර විසිපහ හැඳින්වූයේ ස්පර්ශ යන නමින් ය. ඒ ස්පර්ශ අක්ෂර උත්පත්ති ස්ථාන වසයෙන් වර්ග පසකට බෙදිය හැකි වීම නිසා වර්ගාක්ෂර නමින් ද ද්විතීයක ව හැඳින්වී ඇත. එමෙන් ම ඒ සැම වර්ගයක ම අඝෝෂ

අල්පප්‍රාණ, අඝෝෂ මහාප්‍රාණ, ඝෝෂ අල්පප්‍රාණ, ඝෝෂ මහාප්‍රාණ, නාසික්‍ය යන අක්ෂර වර්ග පහ තිබීම ද හේතු වන්නට ඇත. කෙසේ වෙතත් වර්ගාක්ෂර යන සංඥා නාමයෙන් ඒ අක්ෂර විසිපහේ උච්චාරණ ලක්ෂණය වූ 'වායුධාරාව පූර්ණ වසයෙන් උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතියේ ස්පර්ශ වීම' යන කරුණ අවධාරණය කෙරෙන්නේ නැත. ඒ හෙයින් ඒ අවධාරණය නොවීම මත ම ඒ අක්ෂර විසිපහ වෙන ම කාණ්ඩයක් වසයෙන් ගැනීමේ හේතුව ද දුරස් වී ඇත. මේ අක්ෂර විසිපහට වර්ගාක්ෂර යන නම භාවිත නො කොට ස්පර්ශාක්ෂර යන සංඥා නාමය ම භාවිත විණි නම් කිසිවෙකු අස්පර්ශ වූ ඌෂ්මාක්ෂර ද ස්පර්ශ ගණයෙහි ලා ම දැක්විය යුතු බවට නොපැවසීමට ඉඩ තිබිණි. වර්ගාක්ෂරවල උච්චාරණ ලක්ෂණය වූ පූර්ණ ස්පර්ශය යන කරුණු නො සලකා වර්ගාක්ෂර යනු උත්පත්ති ස්ථාන අනුව කළ වර්ගීකරණයක් ය යන අදහසින් නම් ඌෂ්මාක්ෂර ද ඒ ඒ වර්ගයන්හි ම දැක්විය යුතු යැයි පවසන්නේ එවිට ඕෂ්ඨජ ඌෂ්මයක් නැති වීම සහ විසර්ගය ද ඌෂ්මයක් නිසා කණ්ඨජ ඌෂ්ම දෙකක් පැවැතීම යන ගැටලු දෙක ඇති වේ. තව ද අන්තඃස්ථාක්ෂර ද ඒ ඒ වර්ගයෙහි ම දැක්විය යුතු ය යන අදහස ඇති විය හැකි ය. එවිට ද කණ්ඨජ අන්තඃස්ථයක් නැති වීම සහ මූර්ධජ අන්තඃස්ථ දෙකක් පැවැතීම යන ගැටලු ඇති වේ. රටා සමමිතිය මත ඇති වන ගැටලු නිසා වඩාත් යෝග්‍ය ක්‍රමය වන්නේ ස්පර්ශ-අස්පර්ශ බෙදීමෙන් පසු අස්පර්ශ වූ අන්තඃස්ථ සහ ඌෂ්මාක්ෂර වෙන ම ගැනීමයි.

අක්ෂර ශික්ෂා වර්ණමාලාව පටිපාටිගත කිරීමේ දී අනුගමනය කොට ඇති මේ ස්පර්ශ-අස්පර්ශ බෙදීම දැනදැන ම ඌෂ්මාක්ෂර ඒ ඒ වගෙහි ම දැක්විය යුතු බවට කුමාරතුංග අදහස් දැක්වී නම් ඔහු මේ ස්පර්ශ-අස්පර්ශ බෙදීම ප්‍රතික්ෂේප කරමින් වෙනත් කරුණු විෂයයෙහි අවධානයක් යොමු කළ බවක් සිතිය යුතු ය. එසේ නම් එයට බලපෑ කරුණු කිහිපයක් උපකල්පනය කළ හැකි ය.

01 තරු අකුරු වැළේ දී ඌෂ්මාක්ෂර ඒ ඒ වගෙහි ලා ම දැක්වීමට බලපෑ වායුධාරාවේ ගමන්මග අනුව අකුරු දැක්විය යුතු ය යන අදහස අනුව ඒ ඒ උත්පත්ති ස්ථාන අනුව ම වායුව මඟින් ඌෂ්මයක් ද ඇති කෙරෙන හෙයින් ඌෂ්මය ද දැක්විය යුතු ය යන්න සිතීම. මෙහි දී අන්තඃස්ථ පිළිබඳ ද ප්‍රශ්න කළ හැකි ය.

02 උත්පත්ති ස්ථාන අනුව වෙන් කළ එක් එක් වර්ගයකට අඝෝෂ අල්පප්‍රාණ, අඝෝෂ මහාප්‍රාණ, ඝෝෂ අල්පප්‍රාණ, ඝෝෂ මහාප්‍රාණ, නාසික්‍ය යන අක්ෂර වර්ග පහක් තිබෙන හෙයින් ඒ ඒ වර්ගයට අයත් වන ලෙස ඌෂ්මාක්ෂර ද දැක්විය හැකි හෙයින් වර්ග පහට අදාළ වන සේ ඌෂ්මාක්ෂර ද දැක්විය යුතු ය යන්න සිතීම. මෙහි දී ඕෂ්ඨජ ඌෂ්මයක් නැති වීම සහ ඒ වෙනුවට නිර්මාණය කර ගත හැකි සංකේතය දන්තෝෂ්ඨජ වීම ද ප්‍රශ්න කළ හැකි ය.

මෙවැනි ගැටලු ඇති කර ගැනීමට වඩා ව්‍යඤ්ජන අක්ෂර ස්පර්ශ - අස්පර්ශ යනුවෙන් වර්ග කොට ස්පර්ශ පළමු වත් අස්පර්ශ දෙවනු වත් දැක්වීම වඩාත් යෝග්‍ය ක්‍රමයයි.

## මූර්ධජ ළකාරය අන්තඃස්ථ අක්ෂර කාණ්ඩයෙහි ම 'ර-ල' අතරෙහි ස්ථාපනය කළ යුතු ය යන අදහස

කුමාරතුංග ව්‍යාකරණ විවරණයේ දී අක්ෂරමාලාව දැක්වීමේ දී මූර්ධජ ළකාරය යථා ස්ථානයේ එනම් අන්තඃස්ථාක්ෂර කාණ්ඩයේ 'ර-ල' මධ්‍යයේ දැක්වුව ද ඒ පිළිබඳ කිසි පැහැදිලි කිරීමක් කර නැත. පාලි ශාබ්දිකයන් මූර්ධජ ළකාරය යථා ස්ථානයේ නො දක්වා විශේෂ ස්ථානයක එනම්ඃ පාලි අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ අන්තයෙහි දක්වා ඇත්තේ අවිනිශ්චිතතාවත් විශේෂතාවත් අනුව ය. සිංහල භාෂාවේ මූර්ධජ ළකාරයේ එවැනි අවිනිශ්චිතතාවක් සහ විශේෂතාවක් නැති හෙයින් එය යථා ස්ථානයේ ම දැක්වීම මැනවි. මෙහි දී කුමාරතුංගගේ කල්පනාව නිවැරදි ය. මූර්ධජ ළකාරය වෙන ම දැක්වීම හේතුවෙන් එය උච්චාරණ ලක්ෂණ අනුව අන්තඃස්ථ අක්ෂරයක් ය යන කරුණ ද නිලීන ව පැවැතිණි. දැන් දැන් මූර්ධජ ළකාරය ද අන්තඃස්ථ බව පිළිගැනෙයි. එසේ පිළිගැනීම සඳහා කුමාරතුංග එහි පටිපාටිය වෙනස් කිරීම ද හේතු වූ වන්නට ඇත.

## විසර්ගය ඌෂ්මාක්ෂර කාණ්ඩයෙහි අන්තයෙහි ස්ථාපනය කළ යුතු ය යන අදහස

කුමාරතුංග ව්‍යාකරණ විවරණයේ දී අක්ෂර මාලාව දැක්වීමේ දී විසර්ගය ඌෂ්මාක්ෂර කාණ්ඩයෙහි අන්තයෙහි දැක්වුව ද ඒ සම්බන්ධයෙන් ද කිසි පැහැදිලි කිරීමක් කර නැත. විසර්ගය ද ඌෂ්මාක්ෂරයක් හෙයින් එය ඌෂ්මාක්ෂර කාණ්ඩයට ගැනීමේ තාර්කික භාවයක් ඇත. එහෙත් අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ දී අනුස්වාරය සහ විසර්ගය වෙන ම ගණනය කොට ඇත්තේ අනුස්වාරය සහ විසර්ගය ස්වරයෝගවාහ හෙවත් පූර්වස්වරාශ්‍රේය ව ම භාවිත වීම වැනි විශේෂතාව පදනම් කොට ගෙන ය. එහෙත් යම් හෙයකින් එහි විශේෂතාව නො සලකා, ඌෂ්මතාව යන ලක්ෂණය පදනම් කොට ගෙන එය ඌෂ්මාක්ෂර කාණ්ඩයට ගන්නේ නම් එය ස්ථාපනය කළ යුත්තේ කුමාරතුංග දක්වන 'ශ ෂ ස හ ඃ' යන ආකාරයට ද යන්න ද විමසිය යුතු ය. 'ශ ෂ ස හ ඃ' යන අක්ෂරවලින් 'ශ ෂ ස ඃ' යන අක්ෂර අඝෝෂ වන අතර 'හ' ඝෝෂ වේ. බහුල අක්ෂර නිසාත් ලඝුක අක්ෂර නිසාත් 'ශ ෂ ස ඃ' යන අක්ෂර මුලින් දැක්වීමට සිදු වේ. උත්පත්ති ස්ථාන වසයෙන් 'ශ ෂ ස ඃ' යන අක්ෂර පෙළ ගැසුවොත් 'ඃ ශ ෂ ස' යනුවෙන් ලැබිය යුතු ය. ඒ අනුව ඌෂ්ම අක්ෂර 'ඃ ශ ෂ ස හ' යනුවෙන් දැක්වීමට සිදු වේ. එවිට කණ්ඨයෙහි උපදින 'ඃ, හ' යන ඌෂ්මාක්ෂර දෙක ආදියට සහ අන්තයට වැටේ. කවර ක්‍රමයකට මෙතැන සැකසුව ද කිසියම් ගැටලුවක් උපදී. ඒ හෙයින් අනුස්වාරයේ සහ විසර්ගයේ විශේෂතාව සලකා එය වෙන ම කාණ්ඩයක් ලෙස ගැනීම උචිත බව පෙනේ.

## සමාලෝචනය

ශාබ්දිකයෙකු වූ කුමාරතුංග මුනිදාස අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ ව්‍යූහය පිළිබඳ යම් අවබෝධයක සිට ඇත. අක්ෂර ශික්ෂා වර්ණමාලාව පිළිබඳ ව විවේචනයක් සහ එයට අන්‍ය වූ ක්‍රමයක් පිළිබඳ අදහසක් කුමාරතුංගට පැවැතියේ ය. අක්ෂර ශික්ෂා වර්ණමාලාවේ

පටිපාටිය පිළිබඳ කුමාරතුංගගේ අවබෝධය අසම්පූර්ණ බවත් ඒ හෙයින් ම ඒ පිළිබඳ ව කරන විවේචන ද අසාධාරණ බවත් ඇකාරයෙන් හෝඩිය ආරම්භ කළ යුතු ය, ඌෂ්මාක්ෂර වර්ගාක්ෂරවල අන්තයෙහි ස්ථානගත කළ යුතු ය, විසර්ගය ඌෂ්මාක්ෂ කාණ්ඩයෙහි අන්තයෙහි ස්ථානගත කළ යුතු ය යන අදහස් විමසීමෙන් පැහැදිලි වේ. එහෙත් මූර්ධජ ළකාරය අන්තඃස්ථාක්ෂර කාණ්ඩයට ගෙන ර - ල මධ්‍යයෙහි පිහිටුවීම සාධාරණ බවත් එසේ දැක්වීම අක්ෂර ශික්ෂා වර්ණමාලා අනුක්‍රමයට ද එකඟ බවත් පැහැදිලි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


කුමාරණතුංග, හේමසිරි, (2009) සිංහල අකුර, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කුමාරතුංග, මුනිදාස, (1939) ''මහෝපාධ්‍යාය ගෛගරයන් ගේ සිංහල ව්‍යාකරණ විවේචනය '' සුබස පළමු වෙළුම 2 කලාපය (1939. ජූලි 24), (සංස්.) කුමාරතුංග මුනිදාස.

(2000) ව්‍යාකරණ විවරණය, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

(1940) ''තරු අකුරු වැළ'' සුබස දෙවන වෙළුම 1-4 කලාප (1940. ජූලි 15), (සංස්.) කුමාරතුංග මුනිදාස.

තෙන්නකෝන්, රැයිපියෙල් (සංස්.), (1980) කාව්‍ය ලක්ෂණ මිණිමාලාව හෙවත් කව් ලකුණු මිණ. කොළඹ: ගුණසේන සහ සමාගම.

රතනසාර හිමි, කහවේ, (1957) සාරාර්ථ චන්ද්‍රිකා නම් වූ සාරස්වතාර්ථ ව්‍යාඛ්‍යාව, කොළඹ: ජිනාලංකාර මුද්‍රණාලය.

විපුල හිමි, ගිනිකටුවැවේ, (2014) සිංහල අක්ෂර මාලාව, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සැබිහෙළ, අලවු ඉසි, (1961), රුවන් පබඳ, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

Senevirathna, Rohana, (2013) Surabhāratīvaraṇārthamahārṇavabinduḥ DOI: 10.6084/m9.figshare.22492582.v1. (accessed 12. 02. 2020)